ශ්‍රේණිය 06

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- **බුද්ධ ධර්මය I,II**

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 2යි.

## I කොටස

- **පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බෝසතාණන් වහන්සේට මනුලොව ඉපදීමට "කාලෝ යංතේ මහාවීර ........" යන ගාථාවෙන් ආරාධනා කළේ,

 I. සටීකාර බ්‍රහ්මයා ය. II. සහම්පති මහා බ්‍රහ්මයා ය. III. අසිත තවුසා ය.

02. පස්මහ බැලුම් බැලූ බෝසතාණන් වහන්සේ මිනිස් ලොව උපදින්නට තීරණය කළසේක. මෙහි **පස්මහ බැලුම්** යන්න හඳුන්වන තවත් නමක් වන්නේ,

 I. පන්සිල් ය. II. පංච මහා විලෝකනය ය. III. ධම්ම පදය ය.

03. සිද්ධාර්ථ කුමරු වප් මඟුල්දා දඹරුක් සෙවණේ දී වැඩූ භාවනාව වූයේ,

 I. මෛත්‍රී භාවනාව යි. II. බුද්ධානුස්සති භාවනාව යි. III. ආනාපාන සති භාවනාව යි.

04. සිදුහත් කුමරුට සර්වමිත්‍ර බමුණු පඬිවරයා ලවා සූසැට කලා ශිල්ප හා සියලු ශාස්ත්‍ර ඉගැන්වීය. මෙහි සූසැට කලා ශිල්ප යනු,

 I. කලාශිල්ප 64කි. II. කලාශිල්ප 20කි. III. කලාශිල්ප 10කි.

05. ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේලා අතරින් අගතනතුර හිමි වූයේ,

 I. සැරියුත් හිමියන්ට ය. II. රාහුල හිමියන්ට ය. III. මුගලන් හිමියන්ට ය.

06. "බුදු බව ලබා පළමුව මගේ රාජ්‍යයට වඩින්නැයි" බෝසතාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ,

 I. බිම්බිසාර රජතුමා ය. II. අජාසත්ත රජතුමා ය. III. සුද්ධෝදන රජතුමා ය.

07. ත්‍රිවිද්‍යාවට අයත් නොවේ.

 I. ආසවක්ඛය ඥානය. II. චුතුපපාත ඥානය. III. ඉද්ධිවිධ ඥානය.

08. **"සද්ධාය සම්පදිත්තේන - දීපේන තමධංසිනා"** යන ගාථාවෙන් පූජා කරනු ලබන්නේ,

 I. සුවඳ දුම් ය. II. පහන් ය. III. ගිලන්පස ය.

09. මෛත්‍රිය යනුවෙන් හඳුන්වන්නේ,

 I. මිතුරු බවයි. II. සමානාත්මතාව යි. III. කරුණාව යි.

10. "ලොව පවතින පණ ඇති හා පණ නැති සියලු දේ වෙනස් වේ." මෙය හඳුන්වන්නේ,............ නමිනි

 I. අනාත්ම II. අනිත්‍ය III. දුක්ඛ

- **11 සිට 15 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

11. ................................................ සිසිල් ගුණයක් සහිත පුෂ්පයකි.
12. ................................................ දිවා රෑ පිං වැඩෙනා ක්‍රියාවකි.
13. සීලය යනු කායික හා ................................................ සංවරය යි.
14. මිහිඳු හිමියන් සමග පැමිණි ................................................ උපාසක ලක්දිව දී පැවිදි විය.
15. බෝධි ආගමනය ලෙස සැලකෙන්නේ ................................................ වැඩම කරවීමයි.

(ශ්‍රී මහා බෝධීන්වහන්සේ, මානෙල්, වන උයන් සෑදීම, වාචසික, භණ්ඩුක )

- **16 සිට 20 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.**

| | | |
|---|---|---|
| 16. | කුල සූත්‍රය | දුක |
| 17. | කුරුණෑගල යුගය | පන්සිය පනස් ජාතක කතා පොත |
| 18. | හත්ථාලක මෙහෙණවර | අරපිරිමැස්ම |
| 19. | අඹ පැනය | භික්ෂුණීන් වහන්සේලා |
| 20. | අනිත්‍යතාව | මිහිඳු හිමි |

( ලකුණු 20 x 2 = 40 )

* *

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01 I. සිද්ධාර්ථ කුමාර උත්පත්තිය හා සම්බන්ධ විශේෂ සිදුවීම් **දෙකක්** ලියන්න.
II. සුද්ධෝදන රජු සිදුහත් කුමරුට තනවා දුන් මාළිගා අතරින් **දෙකක්** නම් කරන්න.
III. ත්‍රිවිධ චෛත්‍යවලින් **දෙකක්** නම් කරන්න.
IV. සත්‍යය සොයා යන ගමනේ දී බෝසතාණන් වහන්සේට හමු වූ ගුරුවරු **දෙදෙනෙකු** නම් කරන්න.
V. විහාරස්ථානයක දී අනුගමනය කරන සිරිත් **දෙකක්** ලියන්න.
VI. රාහුල හිමියන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ **දෙකක්** ලියන්න.
VII. වචනයෙන් සිදුකරන අකුසල් **දෙකක්** ලියා දක්වන්න.
VIII. තුන්දොර නම් කරන්න.
IX. ලෝභකම නිසා දුකට පත්වන බව කියවෙන ජාතක කතාව කුමක් ද?
X. උඳුවප් පෝය දිනය ශාසනික වශයෙන් වැදගත්වන හේතු **දෙකක්** ලියන්න. (ල. 2x10=20)

02. I. පරිසරය දූෂණයට හේතු වන මිනිස් ක්‍රියාකාරකම් **දෙකක්** ලියා දක්වන්න. (ල.02)
II. බුදුරජාණන් වහන්සේ පරිසරයට ඇලුම් කළ බවට උදාහරණ **තුනක්** ලියන්න. (ල.03)
III. පරිසරය රැක ගැනීමට ඔබට කළ හැකි දේවල් **පහක්** ලියන්න. (ල.05)

03. I. සාකේත නුවර සිටු දේවියගේ හිසේ අමාරුවට ප්‍රතිකාර කළ දක්ෂ වෛද්‍යවරයා කවුරුන් ද? (ල.02)
II. බුදුරජාණන් වහන්සේ කුල සූත්‍රයේ දී සම්පත් ආරක්ෂා කර ගැනීමට දේශනා කළ උපදෙස් **තුනක්** ලියන්න. (ල.03)
III. පාසලේ හෝ පොදු ස්ථානවල සම්පත් ආරක්ෂා කරගැනීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියා දක්වන්න. (ල.05)

04. I. **"සබ්බෙ තසන්ති දණ්ඩස්ස - සබ්බේසං ජීවිතං පියං..."** යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කරන්න. (ල.02)
II. එහි අර්ථය නිවැරදිව ලියන්න. (ල.03)
III. සතුන් ආරක්ෂා කර ගැනීමට ඔබ විසින් සිදුකරන යහපත් ක්‍රියා **පහක්** ලියන්න. (ල.05)

05. I. බුදුරදුන් රාහුල හිමියන්ට දේශනා කළ හොඳ නරක හඳුනා ගැනීමේ නිර්ණායක ඇතුළත් සූත්‍ර දේශනාව කුමක්ද? (ල.02)
II. අත්තූපනායික ධර්ම පර්යාය යනු කුමක්දැයි හඳුන්වන්න. (ල.03)
III. හොඳ සහ නරක හඳුනා ගැනීමේ මිනුම් දඬු ලියන්න. (ල.05)

06. I. සිගාල ගෘහපතියාට දේශනා කළ යුතුකම් පිළිබඳ ඉගැන්වෙන සූත්‍ර දේශනාව කුමක් ද? (ල.02)
II. එම සූත්‍රයේ දී බ්‍රහ්ම ලෙස දෙමාපියන් හඳුන්වන්නේ ඇයි? (ල.03)
III. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි දූ දරුවන් විසින් දෙමාපියන් වෙත ඉටු කළ යුතු යුතුකම් **පහ** ලියා දක්වන්න. (ල.05)

07. I. සැදැහැවතෙකු තුළ දැකිය හැකි ලක්ෂණ අතරින් **දෙකක්** ලියන්න. (ල.02)
II. ආකාරවතී ශ්‍රද්ධාව යනු කුමක්දැයි හඳුන්වන්න. (ල.03)
III. ශ්‍රද්ධාව වැඩෙන, පන්සලේ දී භාවිත වන, ශාසනික වචන **පහක්** ලියා එහි අර්ථය ලියන්න. (ල.05)

***

| |
|---|
| උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| බුද්ධ ධර්මය - 6ශ්‍රේණිය |
| තෙවන වාර පරීක්ෂණය |

## **පිළිතුරු පත්‍රය**

1. II
2. II
3. III
4. I
5. II
6. I
7. III
8. II
9. I
10. II
11. මානෙල්
12. වන උයන් සෑදීම
13. වාචසික
14. භණ්ඩුක
15. ශ්‍රී මහාබෝධීන් වහන්සේ
16. අරපිරිමැස්ම
17. පන්සිය පනස් ජාතක පොත
18. භික්ෂුණීන් වහන්සේ
19. මිහිදුහිමි
20. දුක

**11 කොටස**

(01)

I.සතරවරම් දෙවිවරු සාදුකාර දීම

අහසින් සිසිල් හා උණුසුම් දිය දහරා මතුවීම

II. රම්‍ය සුරම්‍ය සුභ

III. **ශාරීරික චෛත්‍ය ,පාරිභෝගික චෛත්‍ය , උද්දේසික චෛත්‍ය**

IV. භග්ගව ආලාරකාලම උද්දකරාම පුත්‍ර

V. පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න.

VI . ඉවසීම

ගුරුවරුන්ට කීකරු වීම

බොරු නොකීම .... ආදිය

VII. බොරු කීම

කේලාම් කීම

හිස් වචන කීම

පරුෂ වචන කීම

VIII. සිත කය වචනය

IX. ස්වර්ණ හංස ජාතක කතාව

X. සංඝමිත්තා තෙරණියගේ වැඩමවීම නිසා භික්ෂුණී සාසනය ආරම්භ වීම

ශ්‍රීමා බෝධීන් වහන්සේ වැඩම කරවීම නිසා මෙරට සංස්කෘතික පරිවර්තනයක් ඇතිවීම

(02)

I. ගස් කැපීම කසල බැහැර කිරීම වනන්තර ගිනි තැබීම......

II. තෙමගුල (16 වන පාඩම බලන්න)

III. ගස් වැල් වැවීම, පරිසරය අපිරිසිදු නොකිරීම, වනාන්තර විනාශ නොකිරිම ආදිය

(03)

I. ජීවක වෛද්‍යවරයා

II. විනාශ වූ දේ වෙනුවට අලුත් දේ සපයා ගැනීම

දිරාගිය දේ සොයා බලා අලුත් වැඩියා කර ගැනීම

අසීමිතව ආහාර පාන ගැනීමෙන් වැළකීම

චරිතවත් ස්ත්‍රියක හෝ පුරුෂයෙකු ප්‍රධානත්වයට පත් කිරීම

III. සුදුසු පිළිතුරට ලකුණු ලබා දෙන්න

(04)

I . සබ්බේ තසන්ති දණ්ඩස්ස-සබ්බේසං ජීවිතං පියං

අත්තානං උපමං කත්වා-න හනෙය්‍ය න ඝාතයෙ

II. සියල්ලෝම දඩුවමින් තැති ගනිති - සියල්ලෝම ජීවිතයට ප්‍රියවෙති .
ඒ හෙයින් තමා උපමා කරගෙන අන්අය නොමරන්න නොමරවන්න

III. සුදුසු පිළිතුරට ලකුණු ලබා දෙන්න

(05)

I. අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රය

II. තමා උපමා කරගෙන හිංසනයෙන් වැලකීම

III. (13 පාඩම 70 පටුව)

(06)

I. සිගාලෝවාද සූත්‍රය

II. සිවුබඹ විහරණ දෙමවුපියන් තුළ ඇති නිසා

II. ආහාරපාන සපයා දීම

අවශ්‍යතා ඉටු කර දීම

පරම්පරාව රැක ගැනීම

පරපුරෙන් පැවරී ඇති දේපල ආරක්ෂා කිරීම

මිය ගිය පසු පිං අනුමෝදනා කිරීම

(07)

I. සිල්වතුන් දැකීමට කැමති

දහම් ඇසීමට කැමති වීම

මසුරු මල දුරුකොට පරිත්‍යාග කිරීම

II. බුද්ධිමත්ව සිතා බලා අවබෝධයකින් තෙරුවන් විශ්වාස කිරීම

III. ආහාර ගැනීම - දානය වළඳනවා, බණ කීම - ධර්මය දේශනා කිරීම, ආහාර - දානය, වතුර - පැන් ආදිය

# LOL.lk BookStore



# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**